# ක්‍රිස්තියානි ධර්මය

**අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සමාන්‍ය පෙළ) විභාගය**

## ***පසුගිය විභාග ප්‍රශ්නෝත්තර***

## ***2017***

**ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ**

**ක්‍රිස්තියානි අධ්‍යාපන කොමිසමේ ප්‍රකාශනයකි.**

## ලකුණු දීමේ පටිපාටිය

1 වන පත්‍රය

| | | ලකුණු |
|---|---|---|
| (1) 1 වන පත්‍රය සඳහා ප්‍රශ්න 40 x 1 බැගින් | = | 40 |

11 වන පත්‍රය

(2) 1 වන ප්‍රශ්නය අනිවාර්ය වේ.

| | | |
|---|---|---|
| එහි එක් කොටසකට ලකුණු 02 බැගින් | = | 20 |

සෙසු තෝරා ගත් ප්‍රශ්න වලට ලකුණු පිරිනැමිය යුත්තේ

| | | ලකුණු |
|---|---|---|
| සෑම ප්‍රශ්නයක්ම | අ) | 02 |
| | ආ) | 03 |
| | ඉ) | 05 |
| | | 10 |

7 වන ප්‍රශ්නයේ තෝරාගත් සටහන් ලිවීමේ කොටස් 02ට එක් කොටසකට 5 x**2 - 10**

| | | |
|---|---|---|
| මුළු ලකුණු සංඛාව | = | 100 |

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය 2017

## දෙසැම්බර්

## ප්‍රශ්න හා පිළිතුරු

### ක්‍රිස්තියානි ධර්මය 1 හා 11

**සැලකිය යුතුයි**

I. සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න
II. අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1),(2),(3),(4), යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරාන්න.

(1) දෙවියන් වහන්සේගේ පණිවුඩකරුවන් ලෙස සැලකෙන්නේ,

(1) පරිසිවරුන්ය (2) දිවැසිවර මීකා
(3) සැන්හෙඩ්‍රින් සභිකයන්ය (4) ලෙවීවරුන්ය

(2) ජේසුස් වහන්සේගේ උපත සමග දිවැසිවැකි සම්පූර්ණ වූයේ,

(1) මෙසියස් වහන්සේගේ පැමිණීමෙනි (2) ස්නාවක ජොහාන්ගේ පැමිණීමෙනි
(3) දූෂිත ක්‍රියා අවසානයට පැමිණීමෙනි (4) රෝම අධිරාජ්‍යයේ පැමිණීමෙනි

(3) "බොහෝදෙනා ඔහුගේ උත්පත්තිය නිමිත්තෙන් ප්‍රීති වන්නාහ". මෙයින් කියැවෙන්නේ,

(1) ජේසුස් වහන්සේගේ උපතය (2) මෝසෙස්ගේ උපතය
(3) සාමුවෙල්ගේ උපතය (4) ස්නාවක ජොහන්ගේ උපතය

(4) සිමියොන් සහ අන්නා වැදගත් වන්නේ ඔවුන්,

(1) දිවැසිවරු වූ නිසාය
(2) ජේරුසෙලමේ දේවමාළිගයේ විසූ අය නිසාය
(3) ජේසු බිළිඳා මෙසියස් ලෙස හඳුනාගෙන ප්‍රකාශ කළ නිසාය
(4) නිතර යාච්ඤාවේ යෙදුනු දැහැමි පුද්ගලයන් නිසාය

(5) "අඳනා දෙකක් ඇති අය නැති අයට දෙත්වා,කෑම ඇති අය නැති අයට දෙත්වා"මෙයින් අපට ලැබෙන පණිවුඩය ,

(1) ආපදා අවස්ථා වලදී කෑම ආදිය බෙදා හැරීම ය
(2) තමා වෙත පැමිණෙන දුප්පතුන් ගැන කණගාටු වීමය
(3) බෙදා ගැනීම තුළින් ක්‍රිස්තුස් වහන්සේට පිදීමට ඉඩප්‍රස්ථා ලැබීමය
(4) ඇඳුම් අවශ්‍යතා ඇති අසල්වැසියන්ට ඇඳුම් දෙකක් දීමය

(6) "වගවලසුන් මැදට බැටළු පැටවුන් යවන්නාක් මෙන් මම ඔබ යවමි."ජේසුස් වහන්සේ මෙසේ සැත්තෑ දෙනාට පැවසුවේ, ,

(1) සමාජයේ සැම දෙනා දුෂ්ඨයන් බව දැක්වීමටය
(2) ධර්මදූත සේවයේදී මුහුණපාන භාරදූර තත්වය දැක්වීමටය
(3) යක්ෂාවේශ වූවන් හා පීඩිතයන්ගෙන් සමාජය ගහන බව දැක්වීමටය
(4) බැටළුවන් මෙන් අහිංසකව ක්‍රියා කිරීමේ වැදගත්කම දැක්වීමටය

(7) ව්‍යවස්ථා ඉක්මවා යන මනුෂ්‍යත්වයේ වැදගත් බව පරිසිවරුනට අවධාරණය කළේ?

(1) සබත් දින අතක් පණ නැති මිනිසා සුව කිරීමෙනි
(2) ලෙවී කැඳවූ අවස්ථාවෙනි
(3) අන්ධ බර්තෙමියුස් සුව කිරීමෙනි
(4) ශතාධිපතියාගේ දාසයා සුව කිරීමෙනි

(8) දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති ජනතාවට වටහා දීමට භාවිතා කළ උපමා වන්නේ,

(1) අකීකරු පුත්‍රයා සහ තලෙන්ත පිළිබඳ උපමා ය
(2) යහපත් සමාරිතයා සහ මහා මංගල භෝජනය යන උපමාය
(3) නැති වූවන් සොයා යෑමේ උපමා සහ මහ මංගල භෝජනය යන උපමාය
(4) අයකැමියා හා පරිසියා සහ නැති වූ කාසිය යන උපමාය

(9) "මාගේ මෑණියෝත් සහෝදරයෝත් නම් දෙවියන් වහන්සේගේ වදන අසා ඒවා පිළිපදින්නෝ වෙති."

ජේසුස් වහන්සේ මෙසේ පැවසීමෙන් අනාවරණය කළේ,

(1) දේව වචන ඇසීමේ වැදගත්කම පෙන්වීමය
(2) දේව රාජ්‍යයේ ගුණාංග ක්‍රියාත්මක කිරීමේ වැදගත්කමය
(3) පවුලේ නිර්මාතෘවරයා මැවුම්කාර දෙවියන් වහන්සේ බවය
(4) ලේ නෑකම අභිබවා යන නව පවුල් සංකල්පය ස්ථාපිත කිරීමය

(10) "ධනවත් වූ ඔබට වන විපතක මහත.." මෙය සම්පූර්ණ කිරීමට ගැළපෙන නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ඔබේ සැප ජීවිතය විඳ හමාරය
(2) ඔබට සාගිනි වනු ඇත
(3) ඔබ ව්‍යාජ පැසසුම් වලට ලක් වනු ඇත
(4) ඔබ හඬා වැලපෙනු ඇත

(11) පෞද්ගලික අවශ්‍යතා ගැන කරදර වීමේ නිශ්ඵල බව දැක්වීමට ජේසුස් වහන්සේ ඉදිරිපත් කළ රූපක දෙක වනුයේ,

(1) පොළොවේ ලුණු සහ ආලෝකය
(2) කෙතේ මානෙල් සහ ආකාශයේ පක්ෂීන්ය
(3) දුගී කාන්තාවගේ පඬුරු දෙකම පූජා කිරීමය
(4) අත්තිවාරම් දෙකය

(12) ආබ්‍රහම්ගේ ජීවිතයෙන් කිතුනුවා චරිතායනය කළ යුතු වැදගත්ම ගුණාංගය වන්නේ,

(1) ස්ථිර ඇදහිල්ලෙන් දේව කැඳවීමට අවනත වීමය
(2) සමාජ සාරධර්ම රක්ෂා කිරීමට ඇප කැප වීමය
(3) සිය පරමාර්ථ නිසි ලෙස ඉටු කර ගැනීමය
(4) අචිදිව ඉවසිල්ලෙන් සිටිමය

(13) පාවුල්ගේ ජීවිතයෙන් කිතුනුවා චරිතායනය කළ යුතු වැදගත්ම ගුණාංගය වනුයේ,

(1) ධෛර්ය හා නොපසුබට වීර්යයෙන් සාක්ෂි දැරීමය
(2) පීඩා මධ්‍යයේ වුවද දේව ප්‍රශංසාවට යොමු වීමය
(3) දෙවන මිෂනාරි ගමනට ජොහාන් මාක් සහභාගි නොකර ගැනීමය
(4) දේව හඬට කීකරු වීම හා යුක්තිය සඳහා නැඟී සිටීමය

(14) "මාගේ ගෘහය යාච්ඤා ගෘහයක් යැයි ලියා ඇත. එහෙත් ඔබ එය සොරුන්ගේ ගුහාවක් කර තිබේ." මෙම ප්‍රකාශයෙන් ජේසුස් වහන්සේ ඉදිරිපත් කළ සත්‍යය වන්නේ,

(1) වංචාකරුවන්ට සහ පව්කරුවන්ට දෙව් මැදුරට පිවිසීමට ඉඩ නොදීම
(2) දේවස්ථාන පොදු නමස්කාරයට පමණක් විවෘත කිරීමය
(3) දෙව් මැදුර සත්‍යයෙන් සහ ආත්මයෙන් නමස්කාර කළ යුතු ස්ථානයක් බවය
(4) දෙව් මැදුර සැමවිට සමාජ සේවා කටයුතු වලට විවෘත කළ යුතු බවය

(15) ජේසුස් වහන්සේ පිළිබඳ නිවැරදි දැක්ම කරා ගෝලයන් ගෙන ඒමට අදාළ වූ වැදගත් සිද්ධිය වනුයේ,

(1) ජේසුස් වහන්සේගේ බෞතිස්ම අවස්ථාවය
(2) පරීක්ෂාවන් ජයගත් අවස්ථාවය
(3) ගෙත්සෙමන උයනේ යාච්ඤාවේ යෙදුනු අවස්ථාවය
(4) ජේසුස් වහන්සේගේ රූප විපර්යාසය වීමේ අවස්ථාවය

(16) ජේසුස් වහන්සේ සිය සේවය ගැන ප්‍රථමයෙන් අනාවරණය කළ අවස්ථාව වූයේ,

(1) කන්ද උඩ දේශනාවය
(2) පරීක්ෂාවලට මුහුණ දුන් විටය
(3) ධීවරයන් කැඳවූ අවස්ථාවය
(4) නාසරෙත් හි සිනගෝග ප්‍රකාශයය

(17) පහත සඳහන් කරුණු සැලකිල්ලට ගන්න,

A. අවශ්‍යතා ඇති අය කෙරෙහි අනුකම්පා කිරීම

B. ජාති කුලභේද අභිබවා උදව් කිරීම

C. තමා සතු ධනය, කාලය හා සම්පත් අන් අය සඳහා වැය කිරීම

D. තම වැඩකටයුතු වලට බාධා නොවන සේ ක්‍රියා කිරීම

මින් යහපත් සමාරිතයාගේ උපමා කතාවෙන් කිතුනු අපට ඇති අභියෝග වන්නේ,

(1) A හා B ය. (2) A හා D ය. (3) B හා C ය. (4) C හා D ය.

(18) යහපත් බැටළු එඬේරුන් වන කිතුනු නායකයන් තුළ දිස්විය යුතු ගුණාංගයක් නොවන්නේ,

(1) නැති වූවන් සොයා යෑමය
(2) ප්‍රේමයෙන් කැපවීමෙන් රැළ බලාගැනීමය
(3) තමාගේ රැළ මගින් ප්‍රයෝජන ලබාගැනීමය
(4) සේවයට කැප වී, තමා බාරයේ ඇති අය ආරක්ෂා කිරීම

(19) පවුලක් තුළ තිබිය යුතු යුතුකම් හා වගකීම් පහත දැක්වේ,

A. අවශ්‍යතා ඇති අය කෙරෙහි අනුකම්පා කිරීම

B. තම දරුවන් වරද කළත් ඔවුන් නිවැරදි බව ප්‍රකාශ කිරීම

C. දරුවන් දෙමව්පියන්ට ගෞරවයෙන් කීකරු වීම

D. අසල්වැසි නිවැසියන් හා සසඳා බලා තම පවුලේ උසස් බව ඒත්තු ගැන්වීම

මින් යහපත් සමාරිතයාගේ උපමා කතාවෙන් කිතුනු අපට ඇති අභියෝග වන්නේ,

(1) A හා B ය. (2) A හා C ය. (3) B හා C ය. (4) C හා D ය.

(20) "ඒකාන්තයෙන් ම සමිඳාණන් වහන්සේ නැගිට සිටින සේක."මෙසේ ප්‍රකාශ කර, නව බලාපොරොත්තුවක් දුන්නේ

(1) එම්මාවුස් ගමට යමින් සිටි ගෝලයන් දෙදෙනාය (2) සොහොන වෙත ගිය ස්ත්‍රීන්ය
(3) මග්දලාහි මරියාය (4) අන් ගෝලයන් වෙත ගිය පේදුරුය

(21) ආධ්‍යාත්මික දිළිඳුකම පිටුදැකීම සඳහා කිතුනුවන්

(1) සම්පත් නිසි පරිදි බෙදී යෑමට ක්‍රියා කළ යුතුය
(2) දිනපතාම ආගමික වතාවත් වලට සහභාගි විය යුතුය
(3) ස්වර්ගීක වස්තු රැස් කිරීමෙහිලා සිත් යොමු කර ක්‍රියා කළ යුතුය
(4) ලෞකිකත්වයේ ජීවත් වෙමින් ආධ්‍යාත්මික බව පෙන්නුම් කළ යුතුය

(22) ජේසුස් වහන්සේගේ දුක්විඳීම හා මරණය ආශ්‍රිතව සත්‍ය පහදාගෙන එයට සාක්ෂි දැරුවේ,

(1) මුර සෙබළුන්ය (2) අරිමාතියේ ජෝසෙප්ය

(3) ජෙරුසෙලමේ ස්ත්‍රීන්ය (4) කිරීනියේ සීමොන්ය

(23) අද සමාජයේ යුක්තියට පිටු පා තම හෘද සාක්ෂියට විරුද්ධව තම ජනප්‍රියභාවය සඳහා ක්‍රියා කරන අය සමාන වන්නේ,

(1) පේදුරුතුමාටය (2) පිලාත් ආණ්ඩුකාරයාටය

(3) ස්නාවක ජොහාන්ටය (4) මග්දලායේ මරියාටය

(24) ජේසුස් වහන්සේ නැවත වඩින මොහොත පිළිබඳව කිතුනුවන්ට දී ඇති මඟපෙන්වීම,

(1) ඔබේ ඉඟපටිය බැඳ පහන් දල්වා තබා ගන්න

(2) ගෙය බිඳීමට පැමිණෙන සොරෙකු මෙන් නොව දන්වා පැමිණෙන්නේය

(3) පැමිණෙන මොහොත හා දවස දේව වචනයේ ලියා ඇත

(4) එකිනෙකාට ඔවුන්ගේ ක්‍රියා අනුව නොව, සාමුහික විපාක දෙන බවය

(25) පාවුල් තුමාගේ ඉගැන්වීම් අනුව සදහටම පවතින ශ්‍රේෂ්ඨතම ධර්මතාව වන්නේ,

(1) දිවැස් වැකි දෙසීම ය (2) අන්‍ය භාෂා වලින් කතා කිරීම ය

(3) ඉවසිලිවන්ත බව ය (4) ප්‍රේමය ය

(26) පහත සඳහන් කරුණු සැලකිල්ලට ගන්න

A. සියල්ල පොදුවේ තබා ගන්නා ලදි

B. රාජකීය දේශපාලන භූමිකාවක් දියත් කරයි

C. එතුමාණෙන්ගේ මරණය පව් කමාව සඳහා පූජාවකි

D. පෙනුමෙන් එතුමා ඉතා ලස්සනය

මේවා අතුරින් යෙසාය දිවැසිවරයාගේ පැවසීමට අනුව දුක් විඳින සේවකයාණෝ තුළ ගැබ්ව ඇති ලක්ෂණ වන්නේ,

(1) A හා B ය. (2) A හා C ය. (3) A හා D ය. (4) B හා D ය.

(27) කමාව පිළිබඳ ජේසුස් වහන්සේගේ ඉගැන්වීම,

(1) සීමා රහිතව කමා වී, කමාව ලබා ගැනීමට අන් අයට කමා විය යුතු බවයි

(2) සහෝදරයනට සත්වරක් කමාවීම සෑහේ

(3) යාච්ඤාවෙන් කමාව අයැදීම අවශ්‍ය නැති බව

(4) කමා වන විට නිතරම කොන්දේසි පැනවිය යුතු බවයි

(28) සදාතන ජීවනය වන කිතුනු බලාපොරොත්තුව ඉටු කර ගැනීමට නම්,

(1) ධර්මිෂ්ඨකම,ජේසුස් වහන්සේ සමග ඒකාබද්ධ වීම හා උතුම් ප්‍රීතිය තිබිය යුතුය

(2) ශුද්ධකම,ධර්මිෂ්ඨකම හා බෙදාගැනීම අවශ්‍යයි

(3) දේව මහිමය ගැන උතුම් ප්‍රිතිය,ශුද්ධකම හා ධර්මිෂ්ඨකම තිබිය යුතුය

(4) ජේසුස් වහන්සේ සමග ඒකාබද්ධ වීම, ධර්මිෂ්ඨකම හා සමාව තිබිය යුතුයි

(29) මුල් කිතුනු සභාව තුළ දක්නට ලැබුනු යහපත් ගුණාංග කීපයක් පහත සඳහන් වේ,

A. සියල්ල පොදුවේ තබා ගන්නා ලදි

B. උපස්ථායක කණ්ඩායමක් පත් කරන ලදි

C. දේව වචනය දේශනා කිරීමේ යෙදුණි

D. එක්සත්ව සහභාගි වෙමින් යාච්ඤාවේ යෙදුණි

මේ අතුරින් සමානාත්මතාවය තහවුරු කිරීමට ගත් පියවර වනුයේ,

(1) A හා B ය. (2) A හා C ය. (3) A හා D ය. (4) B හා D ය.

(30) ආත්මික පිපාසයට ජීවන ජලය ලබා දෙමින් දේව රාජ්‍යට මග පෙන්වූ අවස්ථාවක් වනුයේ,

(1) සමාරිත ස්ත්‍රිය සමග ජේසුස් වහන්සේ පැවැත්වූ සංවාදයය
(2) මතෙව් කැඳවූ අවස්ථාවේ සංවාදයය
(3) පේදුරුගේ අපලාපයය
(4) නිකදේමුස් සමග පැවැත් වූ සංවාදය ය

(31) පහත සඳහන් වන්නේ ජේසුස් වහන්සේ ජනතාව හා සම්බන්ධ වූ ස්ථාන,කැඳවීම හා ඔවුන්ගේ ප්‍රතිචාරයය,

| | ස්ථානය | කැඳවීම | ප්‍රතිචාරය |
|---|---|---|---|
| A | නාසරෙත්හි සිනගෝගය | දෙවියන් වහන්සේගේ මෙහෙවරට | ජනතාව සිනගෝගය තුළම රැඳී සිටීම |
| B | තිබේරියස් විල අසළ | ජනතාවට දේශනා කිරීම | මුළු ජනතාවට සවන් දීමෙන් පමණක් සිටීම |
| C | ජේසුස් වහන්සේ සිටි තැනම | ශ්‍රාවකයන් 12 දෙනා සහ 70 දෙනා | උන්වහන්සේගේ නාමයෙන් පිටත්ව යෑම |
| D | ගලීලයේ මුහුද අසළ | පේදුරුට කළ අභියෝගය | ජේසුස් වහන්සේගේ ප්‍රේරිතයෙක් වීම |

(1) A හා B ය. (2) A හා C ය. (3) B හා D ය. (4) C හා D ය.

(32) කුණාටුව මැද පාවුල් සිරකරුවෙකු වුවද ඔහුගේ ක්‍රියා කලාපය මගින් අප ජීවිත වලට චරිතායනය කළ යුත්තේ,

(1) ජීවිතය සුළි සුළං කුණාටුවලට අසුවීමට හැකි බව ය
(2) ජීවිතයේ අර්බුද මධ්‍යයේ වුවද දෙවියන් වහන්සේට සාක්ෂි දැරීමය
(3) නැවියන් හා අධිපතින්ගේ තීරණ නිවැරදි බවට පිළිගැනීම ය
(4) දෙවියන් වහන්සේ නිතර දර්ශන මගින් කතා කරන බව ය

(33) ගලාතිවාසීන්ට යැවූ පාවුල්තුමාගේ ලිපිය අනුව

(1) වෛරය, ඊර්ෂ්‍යාව, මත්ද්‍රව්‍ය හා සුරාසූදුවෙන් වැළකී සිටීමය
(2) තමාට ප්‍රේම කරන අයට පමණක් ඉවසීම හා මෘදුකමින් සැලකීමටය
(3) තමාට කරුණාව දක්වන අයට සමා වීමටය
(4) වරදට පොළඹවන සම වයස් කණ්ඩායමෙන් ඈත්වීමය

(34) සහජීවනයෙන් බහුවිධ සමාජයක ජීවත්වන කිතුනුවෙකු අවනත නොවිය යුත්තේ,

(1) අන්‍ය ආගමිකයන් හා ජාතීන් සමග ඔවුන්ගේ උත්සව වලට සහභාගි වීමය
(2) සංස්කෘති උත්සව ආදියේදී කිතුනු අනන්‍යතාවය රැකගැනීමය
(3) සියලු ආගම් වල සමානාත්මතාවයක් ඇති බව පිළිගැනීමය
(4) සමාජ සේවා ක්‍රියාවලියේදී සියලු දෙනා සමඟ එක්වීමය

(35) පහත සඳහන් කරුණු සැලකිල්ලට ගන්න

A. ජීවිත නාවෝදය ගැන උදම් වීම

B. දේව හඬට කීකරු වී ශුද්ධාත්ම බලයෙන් සවිය ලැබීම

C. දුක් පීඩා මධ්‍යයේ වුවත් ධෛර්යයයෙන් අභියෝග වලට මුහුණ දීම

D. තමාගන්නා තීරණ සැමවිටම දේව කැමැත්ත ලෙස සැලකීම

මේ අතුරින් සැබෑ ජීවිත පරිවර්තනයක් අත්දුටු පාවුල්තුමාගෙන් කිතුනුවෙකු චරිතායනය කළ යුත්තේ,

(1) A හා B ය. (2) A හා D ය. (3) B හා C ය. (4) B හා D ය.

(36) ගරු මයිකල් ලැප්ස්ලි දේවගැතිතුමා වැදගත් වන්නේ කුමක් නිසාද?

(1) දකුණු අප්‍රිකාවේ කළු සුදු භේදය අතර සාමයට ක්‍රියා කිරීම නිසාය

(2) ඇමරිකාවේ සුදු භේදයට එරෙහිව නැගී සිටීම නිසාය

(3) පිවිතුරු ජීවිතයකට ජනතාව කැඳවීමේ මෙහෙවර නිසාය

(4) දුගී අයගේ ජීවිත නගාසිටුවීමට ක්‍රියා කිරීම නිසාය

(37) ජේසුස් වහන්සේ අනුගාමී වන අය සෞභාග්‍ය ජීවිතයක් අපේක්ෂා **නොකළ යුතු** බව ප්‍රකාශ වන්නේ කවර ප්‍රකාශයෙන්ද?

(1) නගුලට අත තබා ආපසු බලන කෙනෙක් දේව රාජ්‍යට පටහැනි නොවේ

(2) මළවුන් භූමදානය අප සතු වගකීමකි

(3) හිවලුන්ට බෙනද,පක්ෂීන්ට කැදලිද, ඇත.නමුත් මනුෂ්‍ය පුත්‍රයාට හිස තැබීමට තැනක් නැත

(4) පළමුව"පවුලෙන් සමුගෙන" ඉන් අනතුරුව ඔබ වහන්සේ අනුගාමී වෙමි

(38) "ඔබ කළ වරදට මම කමාව දෙමි" කියා පවසා,ජේසුස් වහන්සේගේ උතුම් ගුණාංගය ක්‍රියාත්මක කළ මෑත කාලීන පුද්ගලයෙකු නම්,

(1) දෙවන ජුවාම් පාවුලු පාප් තුමය

(2) ගරු චන්ද්‍ර ප්‍රනාන්දු දේවගැතිතුමාය

(3) තිස්ස බාලසූරිය දේවගැතිතුමාය

(4) නෙල්සන් මැන්ඩෙලාය

(39) ජේසුස් වහන්සේගේ මිත්‍රයෙකු ලෙස අන්ත දුක් පීඩා වලට මුහුණ දීමේදී අපේ ප්‍රතිචාරය විය යුත්තේ,

(1) එම තත්වය වෙනස් කිරීමට සෑම ප්‍රයත්නයක්ම දැරීමය

(2) "දේව කැමැත්ත වේවා" කියා යාච්ඤා කිරීමය

(3) අපට උදව් වන අය සමග මිත්‍ර සබඳතාවයක් ගොඩනගා ගැනීමය

(4) අපේම අභ්‍යන්තර ශක්තියෙන් එය දරා ගැනීමට යොමු වීමය

(40) "තමන්ගේ කඩුවලින් නගුල් තල ද, හෙල්ල වලින් දෑකැති ද, තලාගනු ලබයි." දිවැසිවර මීකා මෙමගින් අනාවරණය කරනුයේ ,

(1) යුද්ධය අවසන් වූ බවය

(2) යුද්ධ ආම්පන්න වෙනුවට කෘෂි ආම්පන්න මගින් සෞභාග්‍යය උදා කරන බවයි

(3) විනාශකාරි යුද්ධය සඳහා කඩු හෙල්ල අවශ්‍ය බවයි

(4) කෘෂි ආර්ථිකය ඉතා වටින බවයි

## ලකුණු දීමේ පටිපාටිය - 1 පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|---|---|---|---|
| (01 | 2 | (11 | 2 | (21 | 3 | (31 | 1 |
| (02 | 1 | (12 | 1 | (22 | 2 | (32 | 2 |
| (03 | 4 | (13 | 3 | (23 | 2 | (33 | 1 |
| (04 | 3 | (14 | 3 | (24 | 1 | (34 | 3 |
| (05 | 3 | (15 | 4 | (25 | 4 | (35 | 3 |
| (06 | 2 | (16 | 4 | (26 | 2 | (36 | 1 |
| (07 | 1 | (17 | 3 | (27 | 1 | (37 | 3 |
| (08 | 3 | (18 | 3 | (28 | 3 | (38 | 1 |
| (09 | 4 | (19 | 2 | (29 | 3 | (39 | 2 |
| (10 | 1 | (20 | 1 | (30 | 1 | (40 | 2 |

## ක්‍රිස්තියානි ධර්මය 11

**පළමු ප්‍රශ්නය හා තවත් තෝරා ගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

**1. ප්‍රශ්න**

**i.** **" අන්ධකාරයේ ඇවිද්ද සෙනඟ මහත් ආලෝකයක් දුටුවෝය" මෙහි තද කළු අකුරින් අක්වා ඇති පද දෙකෙන් අදහස් කරන්නේ කුමක්ද?**

අන්ධකාරය - පාපය හා වැරදි ක්‍රියා

ආලෝකය - ජේසුස් වහන්සේ **ලකුණු 02**

**ii.** ස්නාවක ජොහාන්ගේ චරිතයෙන් අපට අනුගත කරගත හැකි චරිතාංග දෙකක් වන නිහතමානිබව හා එඩිතරබව දැක්වෙන අවස්ථා එක බැගින් ඉදිරිපත් කරන්න

නිහතමානි බව - පසුව එන තැනැන්වහන්සේගේ පාවහන් පටි මුදන්නට නොසිටීම

එඩිතර බව - හෙරොද් රජුට වරද පෙන්වීම, පරිසිවරුන්ට තරවටු කිරීම තමා වෙත පැමිණි අයට අභියෝග කිරීම. **ලකුණු 02**

**iii.** **මෙසියානු සංකල්පය හා බැඳුණු විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න**

මෙසියානු සංකල්පය - දාවිත්ගේ පරපුරෙන් පැමිණීම, රාජ්‍යය සදාකාලිකවම තිබීම,සාමයේ කුමරා, සාධාරණත්ව යුක්තියට පැමිණීම, අසිරිමත් උපදේශක, විමුක්තිය උදාකිරීම (මෙයින් සාධක 02ක්)

**ලකුණු 02**

**iv.** (අ) පෙන්තකොස්ත මංගල්‍යය ජුදෙව් ජනතාවට විශේෂ වූයේ කෙසේද?
(ආ) කිතුනු අපට පෙන්තකොස්ත දිනය විශේෂ වන්නේ කුමක් හෙයින්ද?

(අ) ජුදෙව් පෙන්තකොස්තය - පළමු එළදාව දෙවියන්ට පිදීම

(ආ)කිතුනු පෙන්තකොස්තය - ශුද්ධාත්ම ආගමනය ලැබීම, 3000ක් පමණ අළුත් සභාවය එක්වීම ආරම්භය **ලකුණු 02**

v. **සද්දුසිවරු ජේසුස් වහන්සේට ඉදිරිපත් කළ ප්‍රශ්න දෙකක් ගෙනහැර දක්වන්න**

සද්දුසිවරු ඉදිරිපත් කළ ප්‍රශ්න - රෝම අධිරාජ්‍යට බදු ගෙවීම
නැවත නැගිටීම පිළිබඳ කථාව/ප්‍රශ්ණය
දේව මාලිගය පවිත්‍ර කිරීමට අධිකාරි බලය කෙසේද

**ලකුණු 02**

vi. **(අ) ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් වල මූලික තේමාව කුමක්ද?**
**(ආ) එම තේමාව ප්‍රකාශ කිරීමට හා ක්‍රියාත්මක කිරීමට යොදාගත් එක් පියවරක් ඉදිරිපත් කරන්න**

ඉගැන්වීම් වල මූලික හරය - දේව රාජ්‍යය, ප්‍රේමය මත පදනම් වීම
ක්‍රියාත්මක කිරීමට ගත් පියවර - දේශන, උපමා කතා, ප්‍රතිහාර්ය, ඇරමයික් පහසු බස භාවිතය

**ලකුණු 02**

vii. **රූප විපර්යාස සිද්ධිය අවස්ථාවේ ජේසුස් වහන්සේ දෙපස දර්ශනය වූ දෙදෙනාගෙන් එක් අයෙකු නම් කර, ඔවුන් ජේසුස් වහන්සේ සමග සාකච්ඡා කළේ කුමක්දැයි සඳහන් කරන්න**

රූප විපර්යාස අවස්ථාවේ ඔවුන් සමග සාකච්ඡා කළේ - මෝසෙස් සහ එළියා

ජේසුස් වහන්සේගේ මරණය මගින් ව්‍යවස්ථාව සම්පූර්ණ වීම, ජෙරුසෙලමේ දේව මාළිගාවේදී කරන කුරුසි පූජාවය ලකුණු 02

viii. **පාවුල්තුමා දහම් සේවයේ නිරත වීමේදී ස්ථානෝචිත ප්‍රඥාවෙන් ක්‍රියා කල අවස්ථා දෙකකට උදාහරණ දෙන්න**

1. ඇතන්ස්හී ඔවුන්ගේම සාහිත්‍යය භාවිතය නාඳුනන දෙවියන්ට කැපවූ පූජාසනය භාවිතා කිරීම
2. ලුස්ත්‍රාවේ කොරා සුව කළ විට දෙවියන් වහන්සේගේ නාමයෙන් දේශනා කිරීමට අවස්ථාව ගැනීම
3. පාපස්හි සර්ගියස් පාවුල්
4. රෝම පුරවැසිභාවය නිසා සීසර්ගේ විනිශ්චය ඉල්ලීම ලකුණු 02

ix. **"සැබෑ මිදිවැල"** යන රූපකය මගින් ජේසුස් වහන්සේ ඉදිරිපත් කරන ලද පණිවුඩ දෙකක් අප ජීවිතයට වැදගත් වන්නේ කෙසේද?

සැබෑ මිදිවැල - ජේසුස් වහන්සේ සමඟ සම්බන්ධ වීමේ වැදගත්කම නිසි ඵල දැරීමට සම්බන්ධවීම අවශ්‍ය බව එසේ නොවී නම් ඵල නොදරන අයට දේව රාජ්‍යය තැනක් අහිමි වන බව
**ලකුණු 02**

x. **සමාජ සාධාරණත්වයේ වැදගත්කම දැක්වූ දිවැසිවරයා හා දෙවියන් වහන්සේගේ ශුද්ධභාවය ප්‍රකාශ කළ දිවැසිවරයා පිළිවලින් නම් කරන්න**
සාධාරණය පැවසූ දිවැසිවරයා - ආමොස්
දෙවියන් වහන්සේ ශුද්ධ භාවය පැවසූ දිවැසිවරයා - යෙසායා **ලකුණු 02**

**(මුළු ලකුණු 20)**

**(2) "නුඹේ දෙවි වන ස්වාමින් වහන්සේට පමණක් නමස්කාර කරන්න"**

**(i) මෙම වදන ජේසුස් වහන්සේ ප්‍රකාශ කළ අවස්ථාව ලුහුඬින් ඉදිරිපත් කරන්න**

දින 40 ක් ජේසුස් වහන්සේ නිරාහාරව පාළුකරයේ යාච්ඤා කරමින් සිටි අවස්ථාවේ පරීක්ෂකයා එයින් ඉදිරිපත් කළ දෙවන පරීක්ෂාවට පිළිතුරු වශයෙන්ය **ලකුණු 02**

**(ii) අද අප සිත් හඹා යන ලෞකිකත්වයේ ලක්ෂණ 03ක් ලියන්න**

අද අප ලෞකිකත්වයට නැඹුරුවන සාධක වන්නේ ධනය, බලය, විසිතුරු දේවල්, උසස් වීමේ තරඟය. (ආදී ලෙස ලියා ඇති නිවැරදි සාධක 03 කට )

**(iii) එබඳු ලක්ෂණ අභිබවා කිතුනු අප ක්‍රියා කළ යුතු අන්දම පැහැදිලි කිරීමට කරුණු 05ක් ඉදිරිපත් කරන්න**

වඩාත් අධ්‍යාත්මික දේවල් සඳහා නැඹුරුව යාච්ඤාව, දේව වචනය අධ්‍යනය, දේව රාජ්‍යයේ ගුණධර්ම වන ප්‍රේමය, නිහතමානි බව, තරඟය වෙනුවට බෙදා ගනිමින් අන් අය සමඟ සහොදරත්වය (යනාදී අදහස්)

**ලකුණු** 05

**මුළු ලකුණු** 10

**(3) "දේව රාජ්‍යය ඔබ අතරේය"යි ජේසුස් වහන්සේ ප්‍රකාශ කළ සේක.**

**(i) ඉහත ප්‍රකාශය අනුව දේව රාජ්‍යය පිළිබඳ කරුණු දෙකක් ලියන්න**

යහපත් ගුණධර්ම ක්‍රියා කරන අය අතර දේවරාජ්‍යයේ පැවැත්ම ඇති බව එයට සීමා නැත. දෙවියන් වහන්සේ රජ කරන අතර සැමට විවෘත්තය,රාජ්‍ය සදාකාලිකය. **ලකුණු** 02

**(ii) දේව රාජ්‍යයේ පුරවැසියන් තුළ ගැබ්ව තිබිය යුතු විශේෂිත ගුණාංග තුනක් ඉදිරිපත් කරන්න**

1. අන් අය උදෙසා සැම බාධක ඉවතලා වැය වීම
2. සේවක නායකත්වය එනම් නිහතමානීව නිතර ක්‍රියා කිරීම
3. තම තලෙන්ත භාවිතා කරමින් දේව රාජ්‍යයේ වැඩි වර්ධනයට ක්‍රියා කිරීම
4. නිරතුරුව ස්ථානෝචිත ප්‍රඥාවෙන් ක්‍රියා කිරීම

**ලකුණු** 03

**(iii) කිතුනු ඔබ දේව රාජ්‍යයේ පුරවැසියෙකු ලෙස දේව රාජ්‍යයේ වටිනාකම් එළි දැක්විය යුත්තේ කෙසේදැයි කරුණු 05ක් ඇසුරින් පැහැදිලි කරන්න.**

1. නායක තනතුරක් ලැබුවහොත් අන් අය උදෙසා කැපවීම
2. සමාජයේ සැමව එක ලෙස පිළිගනිමින් උදව්වීමට යොමුවීම
3. හැකියා උපරිම මට්ටමින් ප්‍රයෝජන ගෙන දේව රාජ්‍යයේ අගයන් අනුව ජීවත් වීම
4. ජාති කුලභේද නොතකා මෙම බහුවිධ සමාජයේ සියලුදෙනා උදෙසා ක්‍රියා කිරීම
5. වෙසෙන පරිසරය අනුව ස්ථානෝචිත ප්‍රඥවෙන් ක්‍රියා කිරීම

**ලකුණු** 05

**මුළු ලකුණු** 10

**(i) ජේසුස් වහන්සේ ක්‍රියාත්මක කළ ප්‍රාතිහාර්ය වර්ග කළ හැක්කේ කුමන කාණ්ඩ වලටද?**

**රෝග කෙරෙහි බලය, යක්ෂයන් හා දුෂ්ට ආත්ම පහ කිරීම බලය මරණින් උත්ථාන කිරීම, ස්භාවික ධර්මය අභිබවා ක්‍රියාවන්** **ලකුණු** 02

**(ii) එයින් කාණ්ඩ තුනක් තෝරා, ඒවා කෙරෙහි ජේසුස් වහන්සේගේ ආධිපත්‍ය අනාවරණය වූ අන්දම සනාථ කිරීමට උදාහරණය බැගින් ලියන්න.**

රෝග කෙරෙහි බලය - අංශභාග රෝගියා, ශතාධිපතියාගේ දාසයා

මරණයෙන් නැගිටීම - ජායිරස්ගේ දියණිය, නායින් නුවර වැන්දඹුවාගේ පුත්‍රයා

ස්භාව ධර්මය කෙරෙහි ආධිපත්‍ය - කුණාටුව සංසිඳවීම, පන්දහසකට ආහාර බෙදා දීමවතුර මත ඇවිදීම,වතුර වයින් කිරීම. **ලකුණු 03**

**(iii) ඔබ හෝ ඔබ දන්නා කෙනෙක් අත්දුටු ප්‍රාතිහාර්යන් සඳහන් කර, ඒ සඳහා දේව රාජ්‍යය වෙනුවෙන් ජේසුස් වහන්සේ අපෙන් බලාපොරොත්තු වන ප්‍රතිචාරය පැහැදිලි කරන්න**

සිසුවන් ලියා ඇති ඔවුන් අත්දුටු යම් ප්‍රාතිහාරයක් පිළිබඳ විස්තරයට ප්‍රාතිහාර්යක් යනු කුමක්ද කියා වැටහි ඇද්ද බැලිය යුතුය. ප්‍රාතිහාර්ය තුළ ජීවිත වෙනසක් සිදු වී ඇත්ද සලකා බලන්න විශ්වාසය තැබීම වැදගත්ය. ඇදහිල්ල වර්තමානයේ එම පුද්ගලයාගේ ක්‍රියාමාර්ගයේ නවතාවය සඳහන් විය යුතුය.

**ලකුණු 05**
**මුළු ලකුණු 10**

**(5) (i) "රන්වත් රිදීවත් මට නැත.......ජේසුස් වහන්සේගේ නාමයෙන් ඇවිදින්න."**

**(අ) මෙසේ පැවසුවේ කවුරන් විසින්ද?**

**(ආ) ඊට අදාළ වූ පසුබිම කුමක් වීද?**

පේදුරුතුමා විසින් හිගමන් ඉල්ලමින් දේව මාළිගයේ දොරටුව අසළ සිටි කොරවූ අසරණ මිනිසාගේ ඉල්ලීමට දැක්වූ ප්‍රතිචාරය, ඔහුට ඇවිදීමට සුවයදීම. **ලකුණු 02**

**(ii) එම අවස්ථාවේ සුවපත් වූ පුද්ගලයා පූර්ණ සුවය ලැබූ බවට ඔහුගේ කුමන සාක්ෂි ලෙස දැක්විය හැකිද?**

1. දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීම
2. නැගිට ඇවිදීම
3. දේව මාලිගයේ පිටත සිටි මොහු දේවමාලිගය ඇතුළට යෑම
4. ජේසුස් වහන්සේගේ බලය අත් දැක අනුගාමි වීම **ලකුණු 03**

**(iii) ඉහත සිද්ධිය ආශ්‍රිතව ඊට සමානව ඔබට ඉදිරිපත් වන අභියෝගයකට ඔබ දක්වන විවිධ ප්‍රතිචාර කවරේදැයි පහදන්න.**

1. සියල්ලන් අගය කිරීම
2. දේව අනුහාවය මගින් අන්අයට උදව් වීමට ඉදිරිපත් වීම
3. ලෞකික මුදලට වඩා අධ්‍යාත්මික වටිනාකම් අගය කිරීම
4. දෙවියන් වහන්සේ විසින් පිළිගන්නා සෑම කෙනෙක්වම ප්‍රතික්ෂේප නොකළ යුතුයි. අපගේ වටිනාකම් අභියෝගයට ලක්වේ.
5. අප නොසිතු විරූ අන්දමට දෙවියන් වහන්සේ ක්‍රියා කරන බව ජීවිත පරිවර්තනය විවිධ ලෙස විවිධ අන්දමින් සිදු වන බව.
6. බලාපොරොත්තුවෙන් ක්‍රියා කිරීම, ඒ වෙනුවෙන් යාච්ඤා කිරීම, විශ්වාසයෙන් දේ ලැබීම ඒ වෙනුවෙන් යදින දේ ලැබීම.

**ලකුණු 05**

**මුළු ලකුණු 10**

**(6) "අප වෙසෙන්නේ බහුවිධ සමාජයකය."**

**(i) පාවුල්තුමා සිය තෙවන ධර්ම දූත චාරිකාවේදී එපීසයේ දුටු විවිධ ඇදහීම් හා මතවාද කවරේද?**

යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම්, රූප හා පිළිම වැඳීම,ශාස්ත්‍ර ඇසීම, යකුන් දුරුකිරීමට මාර්ග සෙවීම, ජොහාන් බෞතිස්ත පමණක් අනුගමනය කරන පිරිසක් සිටීම.

ලකුණු 02

**(ii) එපීසයේ තිබූ එම ඇදහීම් හා මතවාද, ආදී අභියෝග කෙරෙහි පාවුල්තුමාගේ ප්‍රතිචාර කෙසේ වීද?**

රූප වැඳීම - අතින් සාදන දෙවිවරු අත බලයක් නොමැති බව පැවසීමෙන් අර්තේමිස්ගේ රූප වෙළඳාමට පහරක් විය. බොහෝ දෙනා එම පිළිම වැඳීමෙන් ඈත්විය.

යක්ෂයන් දුරු කිරීම - ස්කේවායේ පුතුන් ගත් උත්සාහය ව්‍යර්ථ විය. ජේසුස් වහන්සේගේ නාමයේ බලයෙන් දුෂ්ට ආත්ම පලවා හැරීම.

ගුරුකම් යන්ත්‍ර මන්ත්‍ර කෙරෙහි වූ විශ්වාස වලින් ඉවත් වූ ඇදහිලිවතුන් එම දේ අඩංගු පොත් පත් පුළුස්සා දැමීම.

ජොහාන්ගේ බෞතිස්මය කෙරෙහි පමණක් අත්දුටු ඇදහිලිවතුන්ට ශුද්ධාත්ම දානය ලබාදීම.

ලකුණු 03

**(iii) ඉහත සඳහන් සිද්ධි ආශ්‍රිතව පාවුල්තුමාගේ ප්‍රතිචාර දැක්වීමට අනුව වත්මන් ශ්‍රී ලංකාවේ ඔබ අත් දකින්නා වූ මේ හා සමාන සිද්ධි වලට ඔබේ ප්‍රතිචාර කෙසේ විය යුතුද?**

රූප හා පිළිම වැනි දේ කෙරෙහි විශ්වාසයෙන් ඈත්ව දෙවියන් වහන්සේ පමණක් වැඳීමට යොමුවීම. නපුර යථාර්තයක් ලෙස පිළිගෙන එයට නිසි ප්‍රතිචාර දැක්විය යුතුය. යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් කෙරෙහි අදහන අයට එහි ආදීනව පෙන්වා දීම. ශුද්ධාත්ම බෞතිස්මයට සූදානම් වීම සහ ලබා ලැනීමට යොමුවීම වැරදි මතවල එල්බ ගෙන සිටින පුද්ගලයන්ට ඒ ගැන අවබෝධ කිරීම ඔවුන් වෙනුවෙන් යාච්ඤා කිරීම.

ලකුණු 05

**මුළු ලකුණු 10**

**(7) පහත සඳහන් මාතෘකා වලින් දෙකක් තෝරා ගෙන බයිබලයෙන් උදාහරණ සහිතව කෙටි සටහන් ලියන්න**

1. **නූතන සභාවලට මුල් කිතුනු සභාවේ විශේෂ වටිනාකම් වල ඇති වැදගත්කම**
2. **කිතුනු බෞතිස්මය**
3. **සාමය උදෙසා කැප වෙමු**
4. **ජෙරුසෙලම මන්ත්‍රණ සභාව**

1. **මුල් කිතුනු සභාවේ වටිනාකම්** නූතන සභාවන්ට සියල්ල පොදුවේ ගැනීම, එකට සහභාගී වීම,නිරාහාර යාච්ඤාවේ යෙදීම, දේව වචන ප්‍රකාශ කිරීම, ගෙයින් ගෙයට ගොස් රොටී කැඩීම, හවුල් නායකත්වයට, ශුද්ධාත්ම මගපෙන්වීම ලබා නූතන සභාවන්ට භේද නොතකා එකට සහභාගී වීම වැදගත්වේ. නිතර යාච්ඤාවේ යෙදෙමින් දේව ප්‍රශංසාවට යොමුවිය යුතුය. සතියේ එක් දිනක් නොව නිරන්තරයෙන් නිවෙස් වල රැස්වීම් පවත්වා දේව වචනය බෙදා ගනිමින් අවශ්‍යතා සපුරාලීම හා මිත්‍රත්තවය වර්ධනය කරගැනීමේ වැදගත්කම, සුභසාධක ක්‍රියාමගින් අවට සමාජය කෙරෙහි යොමුවීම.

2. **කිතුනු බෞතිස්මය** ජලයෙන් දෝවනය බාහිර සංකේතයක් වුවද ශුද්ධාත්ම දානය ලැබෙන බව කිතුනු විශ්වාසයයි. එයින් මුළු ජීවිතයම ආලෝකමත් වේ. නව ජීවන රටාවකට යොමු විය යුතුය. නිර්භීතව ධෛර්යයෙන් කිතුනුවෙකු ලෙස ඕනෑම අවශ්‍ය අවස්ථාවක දෙවියන් වහන්සේ වෙනුවෙන් සාක්ෂි දැරිය යුතුය. සභාවේ සමාජිකත්වය ලැබීම, ක්‍රිස්තුස් වහන්සේගේ මරණයට හා උත්ථානයට පංගුකාරයෙක් වීම

3. **සාමය සඳහා කැපවීම** ජේසුස් වහන්සේ සාම කුමරා විය. උන්වහන්සේ මෙලොව වැඩිමේදී දේව දූත පණිවුඩය වූයේ දෙවිඳුන්ට මහිමය සහ දේව ප්‍රසාදය ලත් ජනතාව අතර, සාමය වේවා කියාය.මීකා දිවැසිවරයා දක්වා ඇත්තේ ද ජේසුස් වහන්සේගේ පැමිණීමෙන් යුද්ධය වෙනුවට සාමය ස්ථාපිත කරන බවය. සාමය ඇතිකරන්නනෝ දෙවියන් වහන්සේගේ දූදරුවන් ලෙස ජේසුස් වහන්සේ පැවසීම. වෙසෙන නිවස, පාසල, සමාජය තුළ භේද අර්බුද මධ්‍යයේ සාමය ගෙන ඒමට මැදිහත්ව කටයුතු කිරීමට අපේක්ෂිතය.

4. **ජෙරුසෙලම මන්ත්‍රණ සභාව** - මෙය කැඳවූයේ පළමු ධර්මදූත චාරිකාවෙන් පසුය. ජුදෙව් හා අන්‍ය ජාතීන් අතර ඇති වූ වෙනසට පිළියම් යෙදීමටය. ජාකොබ් තුමා මෙහි ප්‍රධානියා විය. පේදුරු පාවුල් වැනි අය අන්‍ය ජාතීන් වෙනුවෙන් කතා කරන ලදි. ජුදෙව්වන්ට උපදෙස් වූයේ අන්‍යජාතීන් චර්ම ඡේදනයෙන් තොරව බාරගත යුතු බවද අන්‍ය ජාතීන් පිළිම වන්දනාවෙන් හා බොටුව මිරිකා මරණ ලද සතුන් අනුභව නොකළ යුතු බවද එම සතුන්ගේ ලෙයින්ද වැලකෙන ලෙස දැක්වීම. මෙය වැදගත් වන්නේ සභාව දෙකඩවීමෙන් වළක්වාගෙන සියලු ජාතීන් එක හා සමානව පිළිගැනීමයි.

**එක් කෙටි සටහන්කට ලකුණු 05 බැගින්**

**මුළු ලකුණු 10**

සියලු ලිපි -

ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ
ක්‍රිස්තියානි අධ්‍යාපන කොමිසම
368/6, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

0112679343

## සුදුසුකම්

* කිතුනු ගුරුවරුන්ගේ පුහුණුව සඳහා සකස් කරන ලද මෙම පාඨමාලාව කිතු දහම පිළිබඳ තමන්ගේ දැනුම වර්ධනය කර ගැනීමට කැමති සියළු කිතුනුවන්ට විවෘතය.

ඉල්ලුම්කරුවන් යටත් පිරිසෙයින් පහත සඳහන් සුදුසුකම් ලබා තිබිය යුතුයි.

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ගණිතය සමඟ සමත් වීම, හා එකී විභාගයේදී සම්මාන 3ක් (භාෂාව, ක්‍රිස්තු ධර්මය ඇතුළු තව එක් විෂයයක්) සම්මාන සහිත වීම.
(රෝමානු කතෝලික නොවන)

අධ්‍යාපන සුදුසුකම් දක්වන සහතිකවල පිටපත් සහ දේවගැතිතුමා සහතික කරන ලද ලිපිය, ඉල්ලුම් පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුයි.

සැයු :- මෙම විභාගයට අදාල ප්‍රශ්න පත්‍රය ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ දහම් පාසල් පොදු පාඨමාලාව මත පදනම් වූවකි.
කිතු දහම ඉගැන්වීමට ගුරුවරු බඳවා ගැනීමේදී මෙම විභාගයෙන් සමත් වීම අවම සුදුසුකමක් ලෙස රජය පිළිගෙන ඇත.

ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය ක්‍රිස්තියානි අධ්‍යාපන කොමිසම මෙහෙයවන

# ආගමික දැනුම පිළිබඳ ජාතික සහතික විභාගය (ධර්මාචාර්යය)

මෙම විභාගය සෑම වසරකම ඔක්තෝම්බර් මස දෙවෙනි සෙනසුරාදා

**අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය ජූලි 31 දාය.**

ලියාපදිංචි කිරීමේ ගාස්තුව
රු.1000.00 දාහකි

එම මුදල් චෙක්පතකින් හෝ මුදලින් එවිය හැක. එසේ නැත්නම්, ටොරිංටන් චතුරශ්‍ර ශාඛාවේ ලංකා බැංකුව ගිණුම් අංක 0002322844 -ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයට තැන්පත් කර, ඔබ ලබා ගන්නා **කුවිතාන්සිය** අයදුම්පත සමඟ අප වෙත යොමු කරන්න.
(මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.)

## විෂය නිර්දේශය



(අ) ජේසුස් වහන්සේගේ ජීවිතය
ජේසුස් වහන්සේගේ ජීවිතය සහ ඉගැන්වීම පිළිබඳ ශුභාරංචි 4 පදනම් කරගෙන අධ්‍යයනය.


(ආ) පුරාණ ගිවිසුම
i. ඉශ්‍රායෙල් ජනනායක චරිත හා ක්‍රියාකාරීත්වය ආබ්‍රහම්, ඊසාක්, ජාකොබ්, ජෝසෙප්, සහ මෝසෙස්.
ii. රජවරු-සාවුල්, දාවිත්, සලමොන් යටතේ ඉශ්‍රායෙල් රාජ්‍යයේ ඉතිහාසය.
iii. දිවැසිවරු- එලියා, එලිෂා පිළිබඳ සාමාන්‍ය අවබෝධය සහ සේවය.

(ඉ)




ආමොස් නමැති දිවැසිවරයාගේ පසුබිම හා ඉගැන්වීම පිළිබඳ පූර්ණ දැනුමක් බලාපොරොත්තුවනු ඇත.

(ඊ) රෝමවරුන්ට ලියන ලද යැවුම් පත්‍රය පිළිබඳ තියුණු අධ්‍යයනයක් අවශ්‍ය වනු ඇත.






(උ) ක්‍රිස්තු වර්ෂ 451 දක්වා
කිතුනු සභා ඉතිහාසයේ පූර්ණ දැනුමක් ලබා ගත යුතුයි.

(ඌ) සභා ඉතිහාසයට ඇතුලත්

වැදගත් චරිත මාටින් ලූතර්,ජෝන්කැල්වින්, ජෝන් වෙස්ලි, විලියම්බූත්, ජෝසප් වාස්, ඉව්ලින් කානි- මොවුන් හා ඔවුන්ගේ සේවය ගැන අවබෝධය.

ඩිඩකේ
ඩයෝග්නීටස්




( එ)
අපෝස්තුළුවරුන්ගේ ශ්‍රේය

National Certificate of Religious Knowledge

## Application Form

Name ☐☐☐☐☐☐☐☐☐☐
☐☐☐☐☐☐☐☐☐☐
☐☐☐☐☐☐☐☐☐☐

Adress - ..........................................................................
..........................................................................
..........................................................................

Date of Birth ☐☐☐☐☐☐☐☐

Denomination- ..........................................................

City applied to sit for the exam ............
..........................................................................

Tel ☐☐☐☐☐☐☐☐☐☐

Medium - ..............................
Registration fee has been paid by (cheque/ cash/cash deposit) cross the unnecessary word.

..............................................
Signature

..........................................................................
Name & the Signature of Priest in charge

**<u>ඔබගේ දැන ගැනීම පිණිසයි</u>**

## අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය

# ක්‍රිස්තු ධර්මය

- පසුගිය විභාග ප්‍රශ්නෝත්තර 2008 සිට 2012 දක්වා පොත
- පසුගිය විභාග ප්‍රශ්නෝත්තර 2013 පමණක්
- පසුගිය විභාග ප්‍රශ්නෝත්තර 2014 පමණක්
- පසුගිය විභාග ප්‍රශ්නෝත්තර 2015 පමණක්
- පසුගිය විභාග ප්‍රශ්නෝත්තර 2016 පමණක්
- පසුගිය විභාග ප්‍රශ්නෝත්තර 2017 පමණක්

*ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ*
*ක්‍රිස්තියානි අධ්‍යාපන කොමිසම,*
*368/6, බෞද්ධාලෝක මාවත,*
*කොළඹ 07*

දුරකථන අංකය- 011 2679343
ෆැක්ස් අංකය - 0112671721
විද්‍යුත් තැපෑල - edu@nccsl.org